ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
(සමාගම් අංකය: PB5180)
ඇක්සස් ටවර්ස් **II** (14 වන මහල),
නො. 278/4, යුනියන් පෙදෙස, කොළඹ 02,
ශ්‍රී ලංකාව.
දුරකථන:+94 11 2428428 | ෆැක්ස්:+94 11 2438438
විද්‍යුත් තැපෑල (Email): info@fairfirst.lk |
වෙබ් අඩවිය: www.fairfirst.lk

රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය (IPID)

උත්සව අවලංගු කිරීමේ රක්ෂණ ඔප්පුව (Cancellation of Event Insurance Policy)

මෙම ලේඛනය මඟින් ඔබගේ රක්ෂණ ඔප්පුව පිළිබඳ කෙටි සාරාංශයක් සපයයි. සම්පූර්ණ විස්තර සඳහා, කරුණාකර සම්පූර්ණ රක්ෂණ ඔප්පු ලේඛනය (Policy Document) සහ උපලේඛනය (Schedule) පරිශීලනය කරන්න. කිසියම් නොගැලපීමක් හෝ පරස්පරතාවක් ඇති වුවහොත්, රක්ෂණ ඔප්පු ලේඛනයේ (Policy Document) සඳහන් කරුණු බලාත්මක වේ.

1. රක්ෂණ ආවරණ වර්ගය

උත්සව අවලංගු කිරීමේ රක්ෂණ ඔප්පුව සකස් කර ඇත්තේ, රක්ෂිතයාගේ පාලනයෙන් තොර සහ රක්ෂණ ඔප්පුවේ නිශ්චිතව දක්වා ඇති හේතූන් මත රක්ෂිත උත්සවයක් අනිවාර්යයෙන්ම අවලංගු කිරීම, අතහැර දැමීම, කල් තැබීම, බාධා පැමිණීම හෝ වෙනත් ස්ථානයකට ගෙන යාම නිසා සිදුවන මූල්‍යමය අලාභයන්ගෙන් සිදුවීම් සංවිධායකවරයා ආරක්ෂා කිරීම සඳහා ය.

2. ප්‍රධාන ප්‍රතිලාභ (ආවරණය වන කරුණු)

2.1 **උත්සවයක් අවලංගු කිරීම හෝ අතහැර දැමීම**: රක්ෂිත හේතූන් මත සිදුවන වැළැක්විය නොහැකි අවලංගු කිරීම් හෝ අතහැර දැමීම් නිසා සිදුවන මූල්‍යමය අලාභ ආවරණය කරයි.

2.2 **උත්සවයක් කල් තැබීම, බාධා පැමිණීම හෝ වෙනත් ස්ථානයකට ගෙන යාම**: රක්ෂිත හේතුවක් නිසා **උත්සවයක්** කල් තැබීම, බාධා පැමිණීම හෝ වෙනත් ස්ථානයකට ගෙන යාම නිසා සිදුවන අතිරේක වියදම් හෝ අලාභ ආවරණය කරයි.

2.3 **ආදායම් අහිමි වීම**: කාලසටහනේ දක්වා ඇති පරිදි ටිකට්පත් අලෙවිය, අනුග්‍රාහක ආදායම් හෝ සහභාගීත්ව ගාස්තු ඇතුළුව අපේක්ෂිත ආදායම අහිමි වීම ආවරණය කරයි.

2.4 **අතිරේක වියදම්**: රක්ෂිත සිදුවීමකින් පසු සිදුවන අලාභය අවම කර ගැනීම හෝ සමනය කර ගැනීම සඳහා දරන ලද සාධාරණ සහ නැතිවම බැරි අතිරේක පිරිවැය ආවරණය කරයි.

2.5 **නිශ්චිතව සඳහන් කළ උපද්‍රව පදනම** (Named Perils Basis): ආවරණය අදාළ වන්නේ පහත දක්වා ඇති පරිදි රක්ෂණ ඔප්පුවේ වගන්ති සහ කාලසටහන යටතේ නිශ්චිතවම රක්ෂණය කර ඇති හේතූන් සඳහා පමණි:

2.5.1 අයහපත් කාලගුණය

2.5.2 කිලෝමීටර 10 ක අරයක් ඇතුළත සිදුවන බෝම්බ පිපිරීම්

2.5.3 රජය මගින් පනවන ඇඳිරි නීතිය

2.5.4 රාජ්‍ය නායකයාගේ අභාවය හේතුවෙන් ප්‍රකාශයට පත්කරන ජාතික ශෝක කාලය

3. **ප්‍රධාන බැහැර කිරීම් (ආවරණය නොවන කරුණු)**

3.1 **ස්වේච්ඡාවෙන් අවලංගු කිරීම**: රක්ෂිතයාගේ ස්වේච්ඡාවෙන් හෝ පාලනය යටතේ සිදුවන ඕනෑම අවලංගු කිරීමක්, අතහැර දැමීමක් හෝ කල් තැබීමක්.

3.2 **මූල්‍යමය අසාර්ථකත්වය**: රක්ෂිතයාගේ හෝ වෙනත් පාර්ශ්වයක ණය බංකොලොත්භාවය හෝ මූල්‍යමය පැහැර හැරීම් නිසා සිදුවන අලාභ.

3.3 **සහභාගීත්වය මදි වීම**: ටිකට්පත් අලෙවිය අඩු වීම හෝ ප්‍රමාණවත් තරම් පිරිසක් පැමිණ නොසිටීම නිසා පමණක් සිදුවන අලාභ.

3.4 **පූර්වයෙන් දැන සිටි කරුණු**: සිදුවීම අවලංගු කිරීමට හෝ බාධා පැමිණවීමට හේතු විය හැකි බවට රක්ෂණ ඔප්පුව ආරම්භ කිරීමට පෙර රක්ෂිතයා දැන සිටි ඕනෑම කරුණක්.

3.5 **යුද්ධ සහ ත්‍රස්තවාදය**: විශේෂයෙන් අනුමත කර නොමැති නම්, යුද්ධ, ආක්‍රමණ, කැරලි, ත්‍රස්තවාදය හෝ සමාන සිදුවීම් මගින් සෘජුව හෝ වක්‍රව සිදුවන අලාභ.

3.6 **රජයේ හෝ නියාමන ආයතනවල ක්‍රියාමාර්ග**: නීති, රෙගුලාසි හෝ අවසර පත්‍ර කොන්දේසි ඉටු නොකිරීම නිසා සිදුවන අවලංගු කිරීම්.

සටහන: ඉහත දක්වා ඇත්තේ ප්‍රධාන බැහැර කිරීම් පමණි. සම්පූර්ණ බැහැර කිරීම් ලැයිස්තුව සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුවේ අඩංගු වගන්ති බලන්න.

4. **වගකීම් සීමාව** (Limit of Liability)

සමාගමේ උපරිම වගකීම, අදාළ පරිදි ඕනෑම එක් සිදුවීමක් සඳහා සහ සමස්තය (Aggregate) සඳහා රක්ෂණ ඔප්පු කාලසටහනේ සඳහන් රක්ෂිත මුදල (Sum Insured) ඉක්මවා නොයනු ඇත.

5. **රක්ෂණ ගාස්තු (ප්‍රේමියම්) ගෙවීමේ ක්‍රමය**

මෙම රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය ආරම්භ වන්නේ රක්ෂණ කාල සීමාව ආරම්භ වීමට පෙර රක්ෂණ ගාස්තුව (premium) සම්පූර්ණයෙන්ම ලැබීමෙන් පසුව පමණි.

6. **වැදගත් සිද්ධිමය කරුණු (Material Facts) හෙළිදරව් කිරීමේදී රක්ෂණ ඔප්පුහිමියාගේ වගකීම්**

6.1 **හෙළිදරව් කිරීමේ වගකීම: උත්සවයේ** ස්වභාවය, පැවැත්වෙන ස්ථානය, දිනයන්, අපේක්ෂිත සහභාගීත්වය සහ මූල්‍ය ඇස්තමේන්තු ඇතුළු සිදුවීම පිළිබඳ සම්පූර්ණ, සත්‍ය සහ නිවැරදි තොරතුරු ඔබ විසින් සැපයිය යුතුය.

6.2 **අලාභය අවම කිරීම:** රක්ෂිත සිදුවීමකින් පසු සිදුවන යම් අලාභයක් අවම කර ගැනීමට හෝ සමනය කර ගැනීමට ඔබ සියලු සාධාරණ පියවර ගත යුතුය.

6.3 **දැනුම් දීම:** වන්දි ඉල්ලීමකට හේතු විය හැකි යම් කරුණක් පිළිබඳව දැනගත් වහාම ඔබ ඒ පිළිබඳව සමාගම වෙත දැනුම් දිය යුතුය.

6.4 **වාර්තා සහ ලේඛන:** ඔබ නිසි මූල්‍ය වාර්තා තබා ගත යුතු අතර යම් වන්දි ඉල්ලීමක් සනාථ කිරීම සඳහා සහායක ලේඛන සැපයිය යුතුය.

7. **වන්දි ඉල්ලීමක් කිරීමේදී රක්ෂණ ඔප්පුහිමියාගේ වගකීම්**

1 වන පියවර : අවලංගු කිරීමක්, කල් තැබීමක් හෝ වෙනත් රක්ෂිත සිදුවීමක් පිළිබඳව දැනගත් වහාම සමාගම වෙත දැනුම් දෙන්න.

2 වන පියවර : හැකි සෑම අවස්ථාවකදීම, වැඩිදුර අලාභ අවම කර ගැනීමට හෝ වළක්වා ගැනීමට සාධාරණ පියවර ගන්න.

3 වන පියවර : ගිවිසුම්, ඉන්වොයිසි, අයවැය ලේඛන සහ අලාභය පිළිබඳ සාක්ෂි/තහවුරු කිරීම් ඇතුළු සියලුම අදාළ ලේඛන ඉදිරිපත් කරන්න.

4 වන පියවර : හිමිකම්පෑම (වන්දි ඉල්ලීම) තක්සේරු කිරීමේදී සහ නිරවුල් කිරීමේදී සමාගම වෙත පූර්ණ සහයෝගය ලබා දෙන්න.

8. **පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීම** (Complaints and Grievance Handling)

පියවර 1 - ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් (Fairfirst Insurance) අමතන්න:

☎ +94 11 2428282 (පෙ.ව. 8:30 සිට ප.ව. 5:00 දක්වා)

✉ info@fairfirst.lk

ඔබට පවතින ගැටලු ෆෙයාර්ෆස්ට් හි අවදානම් සහ අනුකූලතා (Risk & Compliance) කණ්ඩායම වෙත යොමු කල හැකිය.

පියවර 2 - බාහිර පාර්ශවයන් වෙත යොමු කිරීම (ගැටලුව විසඳී නොමැති නම්):

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL)

☎ +94 11 2335167 | ✉ info@ircsl.gov.lk | 🌐 www.ircsl.gov.lk

රක්ෂණ ඔම්බුඩ්ස්මන් (Insurance Ombudsman)

☎ +94 11 2505542 / +94 11 2505041 |

✉ info@insuranceombudsman.lk | 🌐 www.insuranceombudsman.lk

9. **වැඩි විස්තර සඳහා අප අමතන්න** (Contact Us for More ,Information)

ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (Fairfirst Insurance Limited)

ඇක්සස් ටවර්ස් II (14 වන මහල), අංක 278/4, යූනියන් පෙදෙස, කොළඹ 02, ශ්‍රී ලංකාව.

☎ +94 11 2428428 | ✉ info@fairfirst.lk | 🌐 www.fairfirst.lk

හිමිකම්පෑම් (claims) සම්බන්ධ විමසීම් සඳහා කරුණාකර අප හා සම්බන්ධ වන්න:

විද්‍යුත් තැපෑල: nonmotorclaimsteam@fairfirst.lk

දුරකථන: +94 11 2428618

10. **රක්ෂණ ඔප්පුවේ වැදගත් විශේෂාංග :**

10.1 **ආවරණ පදනම** (Basis of Cover): මෙම රක්ෂණ ඔප්පුව, රක්ෂණ ඔප්පු ලේඛනයේ සහ කාලසටහනේ අර්ථ දක්වා ඇති පරිදි "නම් කරන ලද උපද්‍රව පදනම" (Named perils basis) මත ක්‍රියාත්මක වේ.

10.2 **කපාහැරීම් / දරාගත යුතු ප්‍රමාණය** (Deductible): කාලසටහනේ දක්වා ඇති පරිදි, සෑම අලාභයකටම අදාළ වන කපාහැරීම් හෝ අතිරික්ත ප්‍රමාණය රක්ෂිතයා විසින් දරාගත යුතුය.

10.3 රක්ෂිත මුදල (Sum Insured): රක්ෂිත මුදල මගින් අදාළ සිදුවීම වෙනුවෙන් අවදානමට ලක්ව ඇති මුළු ඇස්තමේන්තුගත දළ ආදායම සහ වියදම් සම්පූර්ණයෙන්ම පිළිඹිබු විය යුතුය.

10.4 භෞමික සීමාව (Territorial Scope): මෙම ආවරණය අදාළ වන්නේ රක්ෂණ ඔප්පු කාලසටහනේ සඳහන් කර ඇති භූගෝලීය සීමාවන් ඇතුළත පමණි.

සටහන: "මෙම IPID (රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය) මඟින් ප්‍රධාන ආවරණය සහ අදාළ නම් අතිරේක ආවරණ මෙන්ම රක්ෂණ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් සැපයීමට අදහස් කරන අතර, එය ඔබේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවලට අනුව සකස් කරන ලද්දක් නොවේ. නිෂ්පාදනයේ සම්පූර්ණ සහ පුද්ගලීකරණය කළ තොරතුරු මෙන්ම බැහැර කිරීම් ඇතුළත් පූර්ව-ගිවිසුම්ගත සහ ගිවිසුම්ගත සම්පූර්ණ කොන්දේසි ඔබේ රක්ෂණ ඔප්පු ලේඛනයේ (policy document) දක්වා ඇත. මෙම IPID ලේඛනය රක්ෂණ ඔප්පුවේ/ගිවිසුමෙහි කොටසක් ලෙස නොසැලකේ. එබැවින්, කිසියම් පරස්පරතාවයක් ඇති වුවහොත් රක්ෂණ ඔප්පු ලේඛනයේ සඳහන් නියමයන් සහ කොන්දේසි බලාත්මක වේ."

****මෙම ලේඛනය සාමාන්‍ය අවබෝධය සඳහා පමණක් සරල ආකෘතියකින් සකස් කර ඇත. කිසියම් පැහැදිලි කිරීමක්, අර්ථ නිරූපණයක් හෝ විෂමතාවක් (විශේෂත්වයක්/පරස්පරයක්) මතු වුවහොත්, නිල ඉංග්‍රීසි රක්ෂණ ඔප්පු පාඨය බලපැවැත්වෙන අතර, සම්පූර්ණ නියමයන්, කොන්දේසි, බැහැර කිරීම් සහ ආවරණ විස්තර සඳහා සැමවිටම එය පරිශීලනය කළ යුතුය.**